**මන්මුනෙයි දකුණ එරුවිල් පත්තු ප්‍රාදේශීය සභාව**
**මඩකලපුව දිස්ත්‍රික්කය**
**--------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 22 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර ඒ පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මන්මුනෙයි දකුණ එරුවිල් පත්තු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වීම. | ඉදිරි කාලවලදී රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව පිළියෙල කිරීම සඳහා උපදෙස් ලබා දී ඇත. |

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සභා බල ප්‍රදේශයේ පිහිටි කොට්ඨාශ කලුදවලෙයි කොට්ඨාශයේ පිහිටි දේපල 3,700 ක් මත හිඟ වරිපනම් බදු රු.260,850 ක් ලෙස ගණනය කර ඇත. එසේ වුවත්, ප්‍රාදේශීය සභාව විසින් ඉදිරිපත් කරනු ලැබූ මූල්‍ය ප්‍රකාශනවලින් සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු හිඟ හිටි ප්‍රමාණය නිවැරදිව ගණනය | 1987 අංක 15 දරන ප්‍රදේශීය සභා පනතේ 16(2) වගන්තිය අනුව වරිපනම් බදු නිවැරදිව ගණනය කර බිල්කර, අයකිරීම සහ හිඟය ගණනය කර ගිණුම්ගත කළ යුතු වීම. | අපගේ සභා බල ප්‍රදේශයට අයත් කලුදවලෙයි ප්‍රදේශයේ පවතින දේපල 3,700 ක් සඳහා වරිපනම් රු.260,850 ක් අයනොකර හිඟහිටි වශයෙන් ගිණුම්වල දැක්වීමට කටයුතු යොදා ඇත. |

| | | | |
|---|---|---|---|
| | කර ගිණුම්ගත නොකිරීමෙන් හිඟහිටි වටිනාකම ශූන්‍ය අගයක් දක්වා තිබුණි. | | |
| (ආ) | ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී 2016 වර්ෂය වෙනුවෙන් වූ මුද්දර ගාස්තු රු.16,740,721 කින් නැගෙනහිර පළාත් භාණ්ඩාගාරයෙන් පරිපාලන වියදම් ලෙස අයකළ 1% ක් හෙවත් රු.168,911 ක් සහ මඩකලපුව හා කල්මුනෙයිහි පිහිටි දිස්ත්‍රික් සහකාර ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්ට ගෙවිය යුතු රු.242,500 ක් ගෙවූ බවට ගිණුම්වල දක්වා නොතිබුණි. | සියළුම ආදායම් ගිණුම්වල දැක්විය යුතු අතර එ මත වූ අඩු කිරීම්ද ඉදිරිපත් කළ යුතු වීම. | ප්‍රාදේශීය සභාවට සම්පූර්ණ මුද්දර ගාස්තුවල අඩුකිරීම් පිළිබඳව ගිණුම්වල නිශ්චිතවම දැක්වීමට කටයුතු කර ඇත. |
| (ඇ) | ප්‍රාදේශීය සභාවට අයත් මෝටර් රථ හා කරත්ත 06 ක් සහ වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට අයත් මෝටර් රථ 05 ක් සභාව විසින් භාවිතා කරමින් පැවතුණි. ඉන් සභාවට අයත් මෝටර් රථ හා කරත්තවල වටිනාකම වර්ෂ 05 කට අධික කාලයක සිට තක්සේරු කර හෝ ප්‍රත්‍යාගණනය නොකර මුළු එකතුව රු.13,147,425 ක් දක්වා තිබුණි. | මෝටර් රථ වාහන හා කරත්ත සහ වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට අයත් මෝටර් රථ සම්බන්ධයෙන් ලේඛනගත කිරීම හා අයිතිය මාරු කිරීම් සිදුකර ගිණුම්වලට එහි වටිනාකම් ගෙනැවිත් නොතිබුණි. | අප සභාවට අයත් මෝටර් රථවල වටිනාකම රු.13,147,425 ක් වේ. ඉන් 2017 වර්ෂයේ JCB යන්ත්‍රයේ වටිනාකම රු.මිලියන 11.5 ද අඩංගු වේ. මේ නිසා, අප සභාවට අයත් සහ වෙනත් දෙපාර්තමේන්තු නමින් ඇති වාහනවල අයිතිය පවරා ගැනීම් සිදු කරනු ලබන අතර වටිනාකම ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. දැනට වාහනවල වටිනාකම ප්‍රත්‍යාගණනය කර ඇත. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ සභාවේ ඉදිරි පස කාර්යාල අලංකරණය සඳහා පළාත් සභාව සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් එකතුව රු.450,240 ක් වටිනා පරිගණක කට්ටල 03 ක් සහ ඡායා පිටපත් යන්ත්‍රයක් පරිත්‍යාග කර තිබූ අතර ඒවා ගිණුම් ගත කර නොතිබුණි. | එකතුව රු.450,240 ක් වටිනා පරිගණක කට්ටල 03 සහ ඡායා පිටපත් යන්ත්‍රයේ වටිනාකම ගිණුම්ගත කළ යුතු වීම. | සභාවේ Front Office System භාවිතය සඳහා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලබාදෙනු ලැබූ පරිගණක සහ ප්‍රින්ටර්වල වටිනාකම ගිණුම්ගත කිරීම සඳහා කටයුතු සලසා ඇත. |

### 1.3.3 අසම්භාව්‍ය බැරකම්

------------------------

2018 දෙසැම්බර් 31 දිනට සභාව විසින් 2011 දෙසැම්බර් 12 දින බාහිර පාර්ශවයන්ට එරෙහිව නඩු පවරා තිබූ අතර, ඒ පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව විසින් 2009 ජනවාරි 19 දින ණය ආපසු අයකර ගැනීමේ ගිවිසුම ප්‍රකාරව රු.460,000 ක් වටිනා ධීවර බෝට්ටුව සහ එහි යන්ත්‍රය ලබා දී තිබුණි. එසේ වුවත්, ඒ සඳහා වන වාරික නොගෙවීම මත නඩු පැවරීමට කටයුතු කර තිබූ අතර මේ සඳහා වූ වියදම් අසම්භාව්‍ය බැරකම් ලෙස ගිණුම්වල දක්වා නොතිබුණි. | අසම්භාව්‍ය බැරකම් ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වීම. | නඩු පැවරීම මත වූ පාඩුව අසම්භාව්‍ය බැරකම් ලෙස ගිණුම්වල හෙළිදරව් කිරීමට තීරණය කර ඇත. |

### 1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

#### (අ) ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල හිඟ හිටව පවතින විදුලි ණය රු.1,656,338 ක් අඛණ්ඩව වර්ෂ 10 කට අධික කාලයක් ගිණුම්වල ඉදිරිපත් කරමින් තිබුණි. එසේ වුවත්, ඒ පිළිබඳ ලියකියවිලි ලේඛනයන් සහ තහවුරු කිරීමේ සාක්ෂි කිසිත් නොමැතිව ගිණුම්වල ඉදිරිපත් කරමින් පැවැති අතර හිඟයන් අයකර ගැනීමට හෝ පොත්වලින් කපාහැරීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අයකිරීම සඳහා ක්‍රියාකළ යුතුවීම. | 1987 වර්ෂයට පෙර ගම් සභාවක් ලෙස පැවැති අවස්ථාවේදී විදුලිය සේවා කටයුතු වෙනුවෙන් ගම් සභාව විසින් ලබා දී තිබුණි. 1987 වර්ෂයෙන් පසුව ප්‍රාදේශීය සභාවන් ලෙස වෙනස් වීමේදී, විදුලි සේවා කටයුතු විදුලිබල මණ්ඩලයටම භාර දී තිබුණි. එම කාලපරිච්ඡේදයේ මහජනතාවට සැපයූ විදුලි ගාස්තු පිළිබඳ විස්තර, විදුලි බල මණ්ඩලයට ලබා දී තිබූ අත්තිකාරම් පිළිබඳ පොත්පත්වල විස්තර නොමැති වීමෙන් ඒවා අයකිරීමට හෝ පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කිරීමට හෝ නොහැකි වී තිබුණි. |

#### (ආ) ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ණයහිමියන් ලෙස දක්වා ඇති ණය ලබාදුන්නන් රු.406,537 ක් සහ බෙදාහැරීමේ ණය රු.2,069,410 ක් වර්ෂ 05 කට අධික කාලයක සිට හඳුනාගෙන නිරවුල් කිරීමට හෝ ඒවා කපාහැරීමට කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට හෝ ඒවා කපාහැරීමට කටයුතු කළ යුතු වීම. | මූල්‍ය ප්‍රකාශනවල ණය හිමියන් ලෙස දක්වා ඇති ණය ලබා දුන්නන් රු.406,537 ක් සහ විදුලිය බෙදාහැරීමේ ණය රු.2,069,410 ක් වර්ෂ 05 කට අධික කාලයක සිට හඳුනාගෙන ඒවා නිරවුල් කිරීමට හෝ කපා හැරිමට කටයුතු කර නොතිබුණි. |

**1.3.5 විගණනයට අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම**

**(අ) තොරතුරු ඉදිරිපත් නොවීම**

එකතුව රු.195,232,508 ක් වටිනා ගිණුම් විෂයයන් 06 ක් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි ඉදිරිපත් නොකිරීමෙන් විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය.

| | ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (i) | ඉඩම් හා ගොඩනැගිලි | 176,821,754 | ඉඩම් ඔප්පු, ස්ථාවර වත්කම් ලේඛනය | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම් ශේෂයන් තහවුරු කිරීමේ සාක්ෂි ඉදිරිපත් කළ යුතු වීම. | ඉඩම් හා ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ, මෝටර් රථ වැනි ස්ථාවර වත්කම් කිහිපයක් සඳහා සාක්ෂි ලැබී ඇති අතර අනෙකුත් ඒවා සඳහා වන ලේඛන ලබාගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. තවද, විදුලිය බෙදාහැරීම සහ වියදම් ණයහිමියන් පිළිබඳ තොරතුරු ලබා ගත නොහැකි විය. |
| (ii) | යන්ත්‍රෝපකරණ | 2,739,168 | ස්ථාවර වත්කම් ලේඛන, අයිතිය තහවුරු කිරීමේ ලේඛන | | |
| (iii) | මෝටර් රථ හා වාහන | 13,147,424 | ස්ථාවර වත්කම් ලේඛන, අයිතිය තහවුරු කිරීමේ ලේඛන | | |
| (iv) | විදුලි ගබඩා අයිතමයන්ගේ ශේෂය | 48,216 | ගබඩා ලේඛන | | |
| (v) | විදුලිය බෙදාහැරීමේ ණය | 2,069,410 | ගෙවිය යුතු ලේඛන | | |
| (vi) | වියදම් ණයහිමියෝ | 406,536 | ගෙවිය යුතු ණය ලේඛනය | | |

**1.4 අනුකූල නොවීම්**

**1.4.1 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව**

| | නීතිරීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 12(1) සහ (2) වගන්තිය සහ පළාත් පාලන නිවාස ඉදිකිරීම් හා කර්මාන්ත අමාත්‍යාංශයේ 1988 ජනවාරි 13 දිනැති අංක 488/16 දරන ගැසට් නිවේදනයේ 31(1) උප වගන්තිය | ප්‍රාදේශීය සභාවල කාර්යයන් පහසු කිරීමේ අරමුණින්, සම්පූර්ණ තීරණ ලබාගැනීම සඳහාත්, සභාවේ මූල්‍ය, ප්‍රතිපත්තිමය සැලසුම්, නිවාස ඉදිකිරීම්, සමාජ සංවර්ධනය, පාරිසරික හා පොදු පහසුකම් වැනි කාරණා සඳහා වෙන වෙනම කමිටු | අදාළ විධිවිධාන ප්‍රකාරව ස්ථාවර කමිටු ස්ථාපිත කර ඒවා විධිමත් ආකාරයෙන් ක්‍රියාත්මක කර උපදෙස් ලබා දිය යුතුය. | සභාවේ කටයුතු පහසු කිරීම සඳහා ඇති කරනු ලැබූ කමිටු ක්‍රියාත්මක කරවීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| | 2015 මැයි මාසයේ පත්කර තිබූ නමුත්, එම කමිටු ක්‍රියාත්මක කිරීම සඳහා 2016 ජුලි 25 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) 1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති මාලාවේ හි 193 වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා තථ්‍ය ආදායම් සහ වියදම් පිළිබඳ තොරතුරු අයවැය සැලැස්ම සමඟ සසඳා විචලනයන් සඳහා පැහැදිලි කිරීම් අඩංගු ප්‍රකාශනය පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ප්‍රකාශයන් නියමිත කාලය තුළ පිළියෙල කර විගණනයට ඉදිරිපත් කළ යුතු වීම. | අයවැය සැලැස්ම හා තථ්‍ය ලැබීම් සඳහා වාර්තාව, හේතු ආදිය ඇතුළත් කර යැවීම සඳහා කටයුතු කර ඇත. |

### 1.4.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 20 වගන්තිය සහ රජයේ ප්‍රසම්පාදන සංග්‍රහයේ 5.4.11 මාර්ගෝපදේශයන්හි දැන්වීම් මත එක් සැපයුම්කරුවෙකු හෝ කොන්ත්‍රාත්කරුවෙකු එකතු කළ අගය මත බදු ඉල්ලීම් කිරීමේදී ඔහු විසින් “වැට් ඉන්වොයිසිය” (VAT Invoice) ඉදිරිපත් කළ විටඔහුට එකතු කළ අගය මත බදු ගෙවිය හැකිය. සමාලෝචිත වර්ෂයේ මිලදී ගනු ලැබූ භාණ්ඩවලින් විවිධ වූ සැපයුම්කරුවන්ට රු.108,548 ක් එකතු කළ අගය මත බදු ලෙස ගෙවා තිබුණි. එසේ වුවත්, එම සැපයුම්කරුවන්ගෙන් “වැට් ඉන්වොයිසිය” (VAT Invoice) ලැබී නොතිබුණි. එසේම, ගෙවනු ලැබූ එකතු කළ අගය මත බදු පිළිබඳව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට හා | දේශීය ආදායම් දෙපාර්තමේන්තු පනතේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු වීම. | VAT බදු පිළිබඳ විස්තර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවටත්, විගණකාධිපතිවරයාටත් යැවීම සඳහා කටයුතු කර ඇත. |

විගණකාධිපතිවරයාට දැනුම් දී නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.20,586,408 ක් වූ අතර ඉකුත් වර්ෂය සමග සැසඳීමේ දී ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ රු.10,691,626 ක්වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.9,894,782 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම් | ලැයිස්තුගත කළ ආදායම් | අයකළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | ලැයිස්තුගත කළ ආදායම් | අයකළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,200,000 | 1,828,310 | 1,828,310 | --- | 762,000 | 1,435,800 | 874,750 | 561,050 |
| කුලී | 15,174,400 | 18,556,129 | 14,753,576 | 3,802,553 | 15,374,400 | 19,019,207 | 13,609,625 | 5,409,582 |
| බලපත්‍ර ගාස්තු | 1,250,000 | 2,412,093 | 1,617,020 | 795,073 | 8,125,000 | 2,139,760 | 8,659,943 | 6,520,183 |
| අනෙකුත් ආදායම් | 62,955,640 | 45,988,563 | 36,178,461 | 9,810,102 | 12,250,000 | 30,812,247 | 14,755,443 | 16,056,804 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දීර්ඝ කාලයක සිට පැවත එන හිඟ කුලී රු.3,802,553 ක් අයකිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ කුලී රු.3,802,553 ක් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | 1985 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය සඳහා හිඟ කුලී රු.3,802,553 ක් දිගු කාලයක සිට පැවතුණි.මේ සඳහා හේතු 1985 සිට 2009 දක්වා කාල පරාසය තුළ රටේ පැවති අර්බුදකාරී වාතාවරණය නිසා අයකළ |

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | | | නොහැකිව අත්හැර තිබුණි. එසේ වුවත්, මේවා සම්බන්ධයෙන් විවිධ අවස්ථාවලදී අදාළ අයට ලිපි මඟින් දැනුම් දී තිබුණත් කිසිදු ආකාරයක ප්‍රගතියක් නොවීය. එසේ වුවත්, 2018 වර්ෂය තුළදී රු.245,000 ක් අයකර ගෙන තිබුණි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු 2016 වර්ෂයට අදාළ වූ ආදායම අයකිරීමකි. එසේම, සභාව විසින් 2017 සහ 2018 වර්ෂ සඳහා ලැබිය යුතු ආදායම් ගිණුම්වල දක්වා නොමැති අතර, නියමිත කාලය තුළ එය අයකිරීම සඳහා ක්‍රියාකර නොමැත. | මුද්දර ගාස්තු සමාලෝචිත වර්ෂය තුළදීම අයකිරීම සඳහා කටයුතු කළ යුතු වීම. | 2017 වර්ෂයට අදාළ වටිනාකම ගිණුම්ගත කිරීමට පියවර ගෙන ඇත. |

### 2.2.3 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ පිහිටි කොට්ඨාශ 11 ක ගම්මාන 15 ක් පැවති අතර 2016 සිට 2018 කාලපරිච්ඡේදය තුළ ගම්මාන 06 කට පමණක් වරිපනම් බදු තක්සේරු කර වරිපනම් බදු අයකරමින් පැවතුණි. සභාව යටතේ පවතින අනෙකුත් ගම්මාන 09 ක් සඳහා වරිපනම් බදු අයකිරීම සඳහා වන ක්‍රියාමාර්ග මන්දගාමී ස්වරූපයක පැවතුණි. | ප්‍රාදේශීය සභාවේ අණපනත් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අප ප්‍රාදේශීය සභාවට අයත් කොට්ඨාශ 11 ක ගම්මාන 15 ක් පැවති නමුත් දැනට ගම්මාන 06 කින් පමණක් වරිපනම් බදු තක්සේරු කර අයකිරීම් කරනු ලැබේ. ඉතිරි ගම්මාන 09 ක් සඳහා වරිපනම් බදු අයකිරීම සඳහා තීරණය නොවැම්බර් මාසයේ ගනු ලැබූ අතර පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාට අදහස් විමසීම සඳහා යවා ඇත. |
| (ආ) | වරිපනම් බදු අයකිරීම සඳහා වාර්ෂිකව සභාව විසින් දේපලහිමියන්ට දෙනු ලබන "K" ආකෘතියේ, ගාස්තු නියමිත කාලයට පෙරාතුව ගෙවන දේපල හිමියන්ට වරිපනම් බදු මත වට්ටම් ලබාදෙනු ලබන බව සඳහන්ව ඇත. එසේ වුවත්, මෙම ආකෘති පත්‍ර, නියමිත කාලය ඉක්ම යාමෙන් පසුව දේපල හිමියන්ට ලබා දී තිබුණි. මේ නිසා වරිපනම් බදු මත ලැබෙන වට්ටම් දේපල හිමියන්ට අහිමි වීමේ | ප්‍රාදේශීය සභාවේ අණපනත් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | වරිපනම් බදු නියමිත කාලය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මානව සම්පත්වල හිඟයක් දැනට තිබේ. වරිපනම් බදු අයකිරීම සඳහා "බදු අයකරන්නන්" තනතුර සඳහා මානව සම්පත් අනුමත කර නොතිබුණි. අප සභාවේ සේවයේ නියුතු අනියම් සේවකයන් 04 දෙනෙකු මාර්ගයෙන් අයකර ගැනීමේ කටයුතු සිදුකෙරේ. මේ නිසා නියමිත කාල පරිච්ඡේදයේ "K" ආකෘති පත්‍ර යැවිය නොහැකි වී ඇත. |

| | | | |
|---|---|---|---|
| | තත්ත්වයක් උද්ගත වී තිබුණි. | | |
| (ඇ) | ප්‍රාදේශීය සභාව විසින් ඉදිරිපත් කරනු ලැබූ 2018 වර්ෂය සඳහා අයවැය සැලසුම් සාරාංශයේ වරිපනම් හා බදු සම්බන්ධයෙන් රු.1,200,000 ක් ආදායම් වශයෙන් ලබාගත හැකි බව දක්වා තිබුණි. එසේ වුවත්, සමාලෝචිත වර්ෂයේ සත්‍ය වශයෙන් අයකර ගත යුතු හිඟ ආදායම් ඇතුළුව ආසන්න වශයෙන් රු.1,400,000 කට වඩා වැඩියෙන් අයකර ගත හැකි බව ලියකියවිලි හා පොත්පත් මඟින් අනාවරණය විය. | ප්‍රාදේශීය සභාවේ අණපනත් වලට අනුව අයකර ගැනීම පිළිබඳව නව තාක්ෂණය හඳුන්වා දී කටයුතු කළ යුතු වීම. | 2018 වර්ෂයේ වරිපනම් බදු අයකිරීම සඳහා ඇස්තමේන්තු කළ අගය රු.1,200,000 ක් වේ. එසේ වුවත්, සමාලෝචිත වර්ෂයේ සත්‍ය වශයෙන්ම අයකළ යුතු හිඟ හිටි වටිනාකම ඇතුළුව ආසන්න වශයෙන් රු.1,400,000 කට වඩා වැඩි ප්‍රමාණයක් අයකළ හැකි බව සඳහන් විය. එසේ වුවත්, 2018 වර්ෂයේ අපේක්ෂිත වටිනාකමට වඩා වැඩියෙන් රු.1,828,310 ක් අයකර ගෙන ඇත. |

### 2.2.4 අනෙකුත් ආදායම්

--------------------

**JCB යන්ත්‍රය භාවිතය**

---------------------

නවප්‍රාදේශීය සභාව විසින් දේශීය ණය සහ සංවර්ධන අරමුදලෙන් (LLDF) යටතේ JCB යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා 2017 පෙබරවාරි මාසයේ ඉහත අරමුදල සමඟ ගිවිසුම්ගතව අදාළ යන්ත්‍රය මිලදී ගෙන තිබුණි. මෙම යන්ත්‍රයේභාවිතය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාවට මෙම යන්ත්‍රය මිලදී ගැනීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය පහසුකම් නොමැති වීම නිසා සභාව විසින් දේශීය ණය සහ සංවර්ධන අරමුදල යටතේ ණය ලබා JCB යන්ත්‍රය මිලදී ගැනීමට තීරණය කර තිබුණි. මේ සඳහා සභාවේ අරමුදලෙන් රු.2,300,000 ක් සහ ණය අරමුදල මඟින් රු.9,200,000 ක් මත රු.11,500,000 කට සභාවේ ආදායම් ඉහළ නංවා ගැනීමේ අරමුණෙන් මිලදී ගෙන තිබුණි. එසේ වුවත්, මෙම යන්ත්‍රය උපයෝජනය කිරීම මඟින් අලාභම ලබා තිබුණි. | මෙවැනි යන්ත්‍ර මිලදී ගැනීමේදී අනාගතයේදී සභාවට ලැබෙන ආදායම් හා සංවර්ධනය පිළිබඳ සමීක්ෂණයන් සිදුකර මිලදී ගැනීම් සිදුකළ යුතු වේ. | JCB යන්ත්‍රය අප සභාවේ ගිවිසුම්ගත කාර්යයන් සහ ගංවතුර වැනි ආපදා තත්ත්වයකදී මෙන්ම සභාවේ ආදායම් ඉහළ නංවා ගැනීමේ අරමුණෙන් මිලදී ගෙන තිබුණි. මෙමඟින් සභාව විසින් අපේක්ෂිත ආදායම් උපයාගත නොහැකි වී ඇත. ඒ සඳහා 2017 වර්ෂයේදී අලුතින් ආයතනයක් තරඟකාරී ලෙස අඩු ගාස්තුවක් සඳහා යන්ත්‍රය සැපයීමට ඉදිරිපත් වීම හේතු වී තිබුණි. මේ නිසා අපේක්ෂා කළ ආදායම් උපයාගත නොහැකි වී තිබුණි. |
| (ආ) | ප්‍රාදේශීය සභාවට, ආදායම් ඉපැයීමේ අපේක්ෂාවෙන් මිලදී ගත් මෙම යන්ත්‍රය මඟින් සභාවේ කාර්යයන්වලට අමතරව පාසල්, ආගමික ස්ථාන, පොදු ආයතන සහ රජයේ දෙපාර්තමේන්තු සඳහා යන්ත්‍ර පැය 383.40 ක් නොමිලයේ මෙම | නොමිලයේ සැපයීම මඟින් සිදුවන පාඩු හිලව් කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග කෙරෙහි අවධානය යොමු කළ යුතුයි. | JCB යන්ත්‍රය ආදායම් ඉපැයීමේ අපේක්ෂාවෙන් මිලදී ගෙන තිබුණි. එසේ වුවත්, සභාවට පාසල් පොදු ආයතන සහ ආගමික ස්ථාන සඳහා නොමිලයේ සැපයීම වලක්වා ගත නොහැකිය. දැනට පාසල්, ආගමික |

| | | | |
|---|---|---|---|
| | සේවාව සැපයීම මගින් රු.1,150,200 ක් අහිමි කර තිබුණි. | | ස්ථාන, පොදු ආයතන, රජයේ දෙපාර්තමේන්තු සඳහා පැයකට රු.1,500.00 බැගින් අයකිරීමට තීරණය කර ඇත. |
| (ඇ) | ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂයේ මෙම යන්ත්‍රය, යන්ත්‍ර පැය 940.50 ක් භාවිතා කර තිබුණි. මේ අනුව, ඉන්ධන යන්ත්‍ර අලුත්වැඩියාව, රියදුරු වැටුප් සහ යන්ත්‍රයේ ණය ආපසු ගෙවීම් ඇතුළුව රු.4,681,818 ක් වැය වී තිබුණි. සභාවේ කාර්යයන් හැර අනෙකුත් කාර්යයන් සඳහා මෙම යන්ත්‍රය, යන්ත්‍ර පැය 557.15 ක් භාවිතා කිරීම නිසා රු.1,671,450 ක් පමණක් උපයාගෙන තිබුණි. මෙය ක්‍රියාවලිය සමීක්ෂණය කළ විට සභාව වාර්ෂිකව රු.2,500,000 ක් ආසන්න වශයෙන් අහිමි කළ යුතුව පැවතුණි. | ආදායම් මාර්ග කෙරෙහි අවධානය යොමු කළ යුතු වීම. | යන්ත්‍ර අලුත්වැඩියාව, රියදුරු වැටුප්, ඉන්ධන සහ යන්ත්‍රයේ ණය අධික වශයෙන් පැවතුණි. යන්ත්‍රය සඳහා ණය දීර්ඝකාලීන ආයෝජනයකි. එම නිසා, එය සභාවේ වත්කමක් වේ. අනෙකුත් වියදම් ඇතිවීම වැලකිය නොහැකිය. දිගුකාලීනව ලාභ උපයාගැනීම සිදුකළ හැකිය. |

### 2.2.5 මුද්දර ගාස්තු සහ උසාවි දඩ මුදල්

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ සියළුම බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ මුදල් රු.8,005,554 ක් සහ මුද්දර ගාස්තු රු.28,207,248 ක් ලැබිය යුතුව තිබුණි.

**මුද්දර ගාස්තු**

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 2017 සහ 2018 කාලපරිච්ඡේදයේ නිශ්චල දේපල පැවරීම් මත මුද්දර ගාස්තු මඩකලපුව සහ කල්මුණේ හි පිහිටි ඉඩම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවෙන් එක්රැස් කර නැගෙනහිර පළාත් භාණ්ඩාගාර ආදායම් බදු දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළ මුද්දර ගාස්තු පළාත් පාලන ආයතන විසින් ලබාගැනීම පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නැගෙනහිර පළාත් සභාවේ 2010 වර්ෂයේ අංක 06 දරන මුද්දර ගාස්තු සංශෝධන 03 වගන්තිය අනුව ගාස්තු අයකළ යුතු වුවද, 2018 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදයට අදාළ මුද්දර ගාස්තු ප්‍රාදේශීය සභාව විසින් ගණනය කර කොමසාරිස් ජනරාල්වරයාගෙන් නියමිත කාල පරාසයන් ඇතුළත අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මුද්දර ගාස්තු ප්‍රාදේශීය සභාව විසින් ගණනය කර කොමසාරිස් ජනරාල්වරයාගෙන් නියමිත කාල පරාසය තුළ අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | නියමිත කාල පරාසය තුළ අයකර ගැනීම සඳහා කටයුතු කරනු ලැබේ. |
| (ආ) | නැගෙනහිර පළාත් ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන්, නැගෙනහිර පළාත් පාලන ආයතන 2008 අංක 01 දරන බදු හා ගාස්තු පැනවීම | නැගෙනහිර පළාත් සභා 2008 අංක 01 දරන බදු හා ගාස්තු පැනවීමටත්, රැස්කිරීම සඳහාත් මූලා | මෙම කරුණ සම්බන්ධයෙන් තොරතුරු ලබාගෙන අයකිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. |

| | | |
|---|---|---|
| සඳහාත්, රැස්කිරීම සඳහාත් මූලා පාලන පනතේ 37 වගන්තිය ප්‍රකාරව, සභා බල ප්‍රදේශයේ පිහිටි නිශ්චල දේපල පැවරීමේදී නැගෙනහිර පළාත් ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් 2016, 2017 සහ 2018 දෙසැම්බර් මස දක්වා කාලපරිච්ඡේදය තුළ ඍජුව හා ජංගම සේවාවන් මඟිනුත් අයකරනු ලැබූ අමතර මුද්දර ගාස්තු පිළිබඳව දේපල හිමියන් විසින් නැගෙනහිර පළාත් ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවා තිබූ මුද්දර ගාස්තු ගණනය කර අයකිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පාලන පනතේ 37 වගන්තිය ප්‍රකාරව මුද්දර ප්‍රාදේශීය සභාව විසින් ගණනය කර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් නියමිත කාලපරාසය තුළ අයකිරීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතු වීම. | |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුඛසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීමපිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

### (අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සභාවේ ආදායම් සහ විධිමත් කිරීම් සඳහා ප්‍රධාන කාරණා 13 ක් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සකස් කර ක්‍රියාත්මක කළ යුතුව පැවතුණි. එසේ වුවත්, ප්‍රාදේශීය සභාව විසින් 2012 අගෝස්තු 04 දින අතුරු ව්‍යවස්ථා පිළිබඳ අදහස් නැගෙනහිර පළාත් පාලන අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා යවා තිබුණි. 2018 දෙසැම්බර් 31 දින වන විටත් ඒ සඳහා අනුමැතිය ලබා ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව, අතුරු ව්‍යවස්ථා සකස් කර ක්රියාත්මක කළ යුතු වීම. | අප සභාව විසින් 2012 අගෝස්තු 04 දින අතුරු ව්‍යවස්ථා පිළිබඳ අදහස් නැගෙනහිර පළාත් පාලන අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා යවා ඇත. ඉන් පසුව, සභාව 2013 වර්ෂය තුළදී විසුරුවා හැර තිබුණි. එසේ වුවත්, එය අනුමත නොකිරීම සභාවේ වගකීමකි. දැනට අතුරු ව්‍යවස්ථා පිළිබඳ සභාවේ අනුමැතිය සහිතව යෝජනා සම්මත කර අමාත්‍යාංශ ලේකම්වරයාට යවා ඇත. |

**(ආ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සභාවේ ආදායම් සහ විධිමත් කිරීම් සඳහා ප්‍රධාන කාරණා 13 ක් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. එසේ වුවත්, අනුමැතිය ලබාගැනීම සඳහා පිළියෙල කළ අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව පැවති ක්‍රියාකාරකම් 13 ක් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව, අතුරු ව්‍යවස්ථා සකස් කර ක්‍රියාත්මක කළ යුතු වීම. | අප සභාවේ අතුරු ව්‍යවස්ථා පළාත් පාලන අමාත්‍යාංශයේ අනුමැතිය නොලැබීමෙන් ඒ පිළිබඳ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල නොකර තිබූ බැවින් 1985 අංක 35 දරන සභා පනත ප්‍රකාරව කාර්යයන් ක්‍රියාත්මක කර තිබුණි. |

**(ඇ) මූල්‍ය ප්‍රතිපාදන ක්‍රියාත්මක නොකිරීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් සභාවේ අරමුදල් සහ නැගෙනහිර පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන පදනම් කරගනිමින් සකස් කළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව, සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව පැවති කාර්යයන් 22 කින් කාර්යයන් 11 ක් සඳහා පමණක් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කර තිබුණි. අනෙකුත් කාර්යයන් සභාවේ නිර්දේශ අනුව වෙනස් කර ක්‍රියාත්මක කර තිබුණි. මේ නිසා මහජනතාවට අවශ්‍ය යැයි හඳුනාගෙන යෝජනා කළ ව්‍යාපෘති 11 ක් ක්‍රියාත්මක කළ නොහැකි වී තිබුණි. | නව සැලසුම් අන්තර්ග්‍රහනය කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වීම. | 2018 වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, 2017 වර්ෂයේදී පිළියෙල කිරීමේදී ප්‍රාදේශීය සභාව සඳහා සභිකයින් තෝරාගෙන නොතිබුණි. 2018 වර්ෂයේදී සභාවේ කාර්යයන් ආරම්භ කළ පසු මෙම සැලැස්මේ බොහෝ වෙනස්කම් සිදුකළ අතර සභාවේ අනුමැතිය මත අලුත් සැලසුම් අන්තර්ග්‍රහනය කර ක්‍රියාත්මක කර තිබුණි. මේ නිසා බෝහෝ සැලසුම් ක්‍රියාත්මක කළ නොහැකි වී තිබුණි. |

**(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් සභාව විසින් ක්‍රියාත්මක කළ දිගුකාලීන හා කෙටිකාලීන වැඩසටහන් සඳහා සමාලෝචිත වර්ෂයේ රු.4,752,654 ක් වැය කර තිබුණි. එසේ වුවත්, සභාවේ ආදායම් ලෙස රු.1,152,040 ක් ලැබී තිබුණි. මෙම ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් වර්ෂ 05 ක සැලැස්මක් පිළියෙල කර එවකට පැවති සභාව විසින් අනුමත කර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. මෙම සැලැස්ම මඟින් යෝජිත වැඩසටහන සඳහා අවශ්‍ය රියදුරු කසළ එකතු කිරීමේ වාහන, සෞඛ්‍ය කම්කරුවන් වැඩිකිරීම හා ගම්මානවල පරිසරය ආරක්ෂා කිරීමේ කමිටු ස්ථාපිත කර එමඟින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සංවර්ධනය කිරීම සඳහා සැලසුම් මේ දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. | ගම්මානවල පරිසරය සුරැකීමේ කමිටු ස්ථාපිත කර සභාවේ පාලනය යටතේ ඇති ප්‍රජා මධ්‍යස්ථාන මාර්ගයෙන් මෙය ක්‍රියාත්මක කිරීම. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අවශ්‍ය මානව සම්පත්වල විස්තර සකස් කර පළාත් පාලන සහකාර කොමසාරිස්වරයා මාර්ගයෙන් යවා ඇත. එසේම, කසළ එක්රැස් කිරීමේ කටයුතු සඳහා අවශ්‍ය වාහන පිළිබඳ ඉල්ලීම්, පළාත් පාලන අමාත්‍යාංශයට යවා ඇත. තවද, ගම්මානවල පරිසරය ආරක්ෂා කිරීමේ කමිටු ස්ථාපිත කිරීම වෙනුවට අප සභාවේ පාලනය යටතේ ඇති ප්‍රජා මධ්‍යස්ථාන මාර්ගයෙන් මෙය ක්‍රියාත්මක කෙරේ. |

**(ඉ) තිරසාර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල රාජ්‍ය නායකයින්ගේ නායකත්වයෙන් 2015 වර්ෂයේ තිරසර සංවර්ධන සම්මේලනයේ තීරණය අනුව සභාව විසින් 2030 වර්ෂයේ ලඟාකරගත යුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් මැනීම සඳහා දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. | 2015 වර්ෂයේ තිරසාර සංවර්ධන සම්මේලනයේ තීරණයන්ට අනුකූලව කටයුතු සිදුකිරීම. | තිරසාර සංවර්ධනය සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ රටවල නායකයින් විසින් තීරණය කරනු ලැබූ දර්ශක ළඟා කරගැනීම සඳහා දර්ශකයන් ස්ථාපිත කර නොතිබුණි. එසේ වුවත්, ඒ සඳහා මෙහෙයුම් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරමින් පවතී. වෛද්‍ය නිලධාරී සමඟ එක්ව මව් හා ළදරු සුභසාධනය පවත්වාගෙන යාම සඳහා ගර්භනී මව්වරුන්ට පෝෂ්‍යදායී ආහාර සැලසුම්, ආපනශාලාවන්හි භාවිතා කරනු ලබන ජලය පිළිබඳ පරීක්ෂාවන් සිදු කර ක්‍රියාමාර්ග ගැනීම්, ඩෙංගු සහ පිරිසිදු පරිසරයක් පවත්වාගෙන යාමට කටයුතු කිරීම, දිළිඳුකමින් පෙළෙන ශිෂ්‍යයින්ට නොමිලයේ අධ්‍යාපන පහසුකම් සැපයීම ආදිය සිදුකෙරේ. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**(i) ඉදිරිපස කාර්යාලයක් ස්ථාපිත කිරීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ සහාය සහිතව ඉදිරිපස කාර්යාලයක් ස්ථාපිත කර සභාවේ බල ප්‍රදේශයේ සිටින ජනතාවට පහසුවෙන් උපකාර කිරීමේ අපේක්ෂාවෙන් එනම් පළාත් පාලන තොරතුරු, සභාවේ තොරතුරු, සංවර්ධන තොරතුරු සහ ආපදා සම්බන්ධ උපකාර කිරීම සඳහා එවැනි කාර්යාලයක් ස්ථාපිත කිරිම සඳහා රු.450,240 ක් සහ සභාවේ අරමුදලින් රු.180,000 කට කාර්යාල උපකරණ සහ අනෙකුත් උපකරණ මිලදී ගැනීම සඳහා වැයකර තිබුණි. එසේ වුවත්, සභාව විසින් විගණන දිනය වන 2019 මාර්තු 31 දින වන විටත් ඉදිරිපස කාර්යාලය ස්ථාපිත කර නොතිබූ අතර එම ලී බඩු හා උපකරණ කාර්යාලයේ වෙනත් අවශ්‍යතාවයක් සඳහා භාවිතා කෙරේ. | සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කළ යුතු වීම. | සභාවේ ඉදිරිපස කාර්යාලය ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ වගකීම භාරගත් සභාවට කඩිනමින් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. ඒ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකිරිමට නියමිතය. |

**(ආ) නිවාඩු ලේඛනය භාවිතය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවේ රාජකාරී කරන නිලධාරීන් සහ සේවකයන් සම්බන්ධයෙන් පවත්වාගෙන යනු ලබන නිවාඩු ලේඛනය විගණනය කිරීමේදී එම සේවකයින්ගේ නිවාඩු ලේඛනයේ කල් ඉකුත් වූ නිවාඩු සම්බන්ධයෙන් ලේඛනගත කිරීම් සිදුකර නොතිබුණි. මේ නිසා නිලධාරියෙකුගේ කල් ඉකුත් වූ නිවාඩු පිළිබඳ තොරතුරු ක්ෂණිකව ලබාගත නොහැකි තත්ත්වයක් පැවතුණි. | නිසි පරිදි නිවාඩු ලේඛනගත කළ යුතු වීම. | සභාවේ නිවාඩු ලේඛනයේ, කල් ඉකුත් වූ නිවාඩු විස්තර ඇතුළත් කිරිම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. |

## 3.3. පාඩු හා හානි අයකර ගැනීමට අපොහොසත් වීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු පොදු වෙළඳපොලේ පිහිටි කඩකාමර 12 ක පැවති හිඟ විදුලිය ගාස්තු 2009 වර්ෂයට පෙර මෙම කඩ කාමර ලබාගත් පුද්ගලයන් සමාලෝචිත වර්ෂය දක්වා ගෙවා නොතිබූ බැවින්, සභාවට සිදු වී තිබූ, මෙම පාඩුව අදාළ පුද්ගලයින්ගෙන් අයකර නොගෙන මෙම හිඟ මුදල් රු.591,317 ක් සභාව විසින් විදුලිබල මණ්ඩලයට ගෙවා තිබූ බැවින් මෙම වටිනාකම සභාවට අලාභයක් වී තිබුණි. | මින් පසුව එළඹෙන කාලවලදී මෙවැනි දෝෂ සිදු නොවිය හැකි අයුරින් සභාවේ තීරණයන් ගත යුතු වීම. | කලවංචිකුඩි පොදු වෙළඳපොලේ ඉහළ මාලයේ පිහිටි කඩ කාමර 12 ක් දිගු කාලයක සිට කුලියට ලබා දී තිබුණි. ඒ සඳහා විදුලි මීටර් භාවිතා නොවීම නිසා ඒ සඳහා මීටර් කුලිය ලෙස මෙම වටිනාකම ගණනය කර තිබුණි. වර්තමානයේ අලුතින් ඉදිකළ කඩ කාමර 21 ක් සඳහා නව විදුලි සම්බන්ධතා ලබාගැනීම සඳහා ඇති විය හැකි වියදමට වඩා එම සඳහන් කුලිය ගෙවා එය අලුත් කඩකාමරවලට සම්බන්ධතාවය ලබාගැනීමෙන් විදුලිය ලබාගැනීම ලාභදායී යැයි පෙනී ගිය බැවින් ගෙවා තිබුණි. මෙය ගෙවීම සඳහා අනුමැතිය පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාගෙන් ලැබී ඇත. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වරිපනම් අයකිරීම සඳහා වාර්ෂිකව සභාව විසින් දේපල හිමියන් වෙත, “K” ආකෘති යැවිය යුතුය. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවතින ඉඩම් සහ ඉදිකරනු ලැබූ නිවාස, ගොඩනැගිලිවලින් බදු අයකළ යුතු බව සඳහන් වුවද, 2018 වර්ෂය සඳහා වරිපනම් බදු ගෙවීම් පත්‍රිකා 2018 ජනවාරි මාසය ඉකුත් වූ පසුව දේපල හිමියන් වෙත ලබා දී තිබුණි. | මෙම ක්‍රියාවන් සම්බන්ධයෙන් විධිමත් සැලැස්මක් ක්‍රියාත්මක කර මහජනයාට සේවාවන් සැපයිය යුතුය. | 2018 වර්ෂය සඳහා වරිපනම් බදු අයකිරීමේ බදු එකතු කරන්නන්ගේ සංඛ්‍යාව 04 කි. එම නිසා, වරිපනම් බදු ඉල්ලුම් කිරීමේ ආකෘති පත්‍ර නිකුත් කිරීම, වැනි කාරණා බදු එකතු කරන්නන් 04 දෙනෙකු පමණක් සිදුකළ යුතුව තිබුණි. එබැවින්, සේවකයින්ගේ හිඟය හේතුවෙන් ආකෘති පත්‍ර නිකුත් කළ නොහැකි වී තිබුණි. |
| (ආ) | සභාවට අයත් දේපල බදු දීමේදී බදු ගිවිසුමේ ඇප ලේඛන ලැබිය යුතු බව සඳහන් වුවද, එවැනි ලේඛන හෝ ඇප මුදල් නොලැබේ. එබැවින්, බදු දේපල ලබාගත් අය බදු | පනතේ විධිවිධානවලට අනුකූලව ක්‍රියාකළ යුතු වීම. | සභාවට අයත් දේපල බදු දීමේදී බදු මුදලින් 50% ක් ගිවිසුම්ගත වීමෙන් සති 02 ක් ඇතුළත ලැබේ. ඉතිරිය සමාන වාරික 06 කින් අයකරනු ලැබේ. මුල් මාස 02 සඳහා වූ වාරික මුදල් ගෙවීම පැහැර හැරීමේදී ඔහුගේ ගිවිසුම අවසන් කරනු ලැබේ. එබැවින් සභාවේ ආදායම් |

| | | | |
|---|---|---|---|
| | මුදල් නොගෙවීමේදී සභාවට ආදායම් අහිමි වීම් සිදුවිය හැකිය. | | අහිමිවීමේ තත්ත්වයක් උද්ගත නොවේ. ඇප ලේඛන සභාවේ නමට මාරුකර ලිවීම සම්බන්ධයෙන් අමතර වැයක් ඇතිවේ. |
| (ඇ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය අනුව විශේෂිත ඇතැම් ඉඩම් විකුණුම් මත 1% ක විකුණුම් බදු අයකරනු ලැබිය යුතුය. එසේ වුවත්, 2017 සහ 2018 වර්ෂවලදී විකුණනු ලැබූ ඉඩම්වල මුළු වටිනාකම වූ රු.333,254,236 කින් බදු වශයෙන් රු.3,332,542 ක් අයකිරීම සඳහා සභාව කටයුතු කර නොතිබුණි. | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය අනුව අයකිරීමට කටයුතු කළ යුතු වීම. | ඉඩම් පොදු ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමේදී පමණක් විකුණුම් මත 1% ක විකුණුම් බදු අයකළ හැකිය. මේ සම්බන්ධයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාගේ ලිපියේ පිටපතක් අමුණා ඇත. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 වත්කම් ලේඛනගත නොකිරීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානය දක්වා සභාවට අයත් ඉඩම් හා ගොඩනැගිලිවල මුළු එකතුව රු.177,218,704 ක් ලෙස ගිණුම්වල දක්වා තිබුණත්, චංචල හා නිශ්චල දේපල ස්ථාවර වත්කම් ලේඛනයේ ලේඛනගත කිරීම සඳහා සභාව කටයුතු කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනයේ ලේඛනගත කිරීම සඳහා සභාව කටයුතු කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂය අවසාන දිනට ඉඩම් හා ගොඩනැගිලිවල මුළු වටිනාකම රු.177,218,704 ක් විය. ඉන් ආසන්න වශයෙන් 60% ක් මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම හේතුවෙන් ඇති වූ මූලධන වියදම් ඇතුළත් කිරීම වේ. ඉතිරි ඒවා ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම වේ. එබැවින්, ඒවා ස්ථාවර වත්කම් ලේඛනයේ ලේඛනගත කිරීමට කටයුතු යොදා ඇත. |

**3.5.2 නඩත්තු හා අලුත්වැඩියා සිදු නොකිරීම**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව විසින් භාවිතා කරනු ලබන වත්කම් නඩත්තු කිරීම හා අලුත්වැඩියා සම්බන්ධයෙන් සභාවට අයත් බයිසිකලයක්, | අලුත්වැඩියා කිරීමට හෝ වෙන්දේසියේ විකිණීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. | සභාවේ පවතින වත්කම්වලින් අලුත්වැඩියා කළ හැකි ඒවා අලුත්වැඩියා කිරීමටත් එලෙස අලුත්වැඩියා කළ නොහැකි නම් ඒවා |

| | | | |
|---|---|---|---|
| | ත්‍රිරෝද රථයක්, ට්‍රැක්ටරයක්, කුඩා ප්‍රමාණයේ ට්‍රැක්ටරයක්, JCB යන්ත්‍රයක් සහ මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය වර්ෂ 03 කට අධික කාලයක් අලුත්වැඩියා කළ හැකි හෝ අලුත්වැඩියා කළ නොහැකි තත්ත්වයේ පැවතුණි. මේවා අලුත්වැඩියා කිරීමට හෝ වෙන්දේසි මඟින් විකිණීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සිදුකර නොතිබුණි. | | විකිණීම සඳහා ක්‍රියාකිරීමට නැගෙනහිර පළාත් යාන්ත්‍රික ඉංජිනේරුවරයා සමඟ සාකච්ඡා කර ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (ආ) | ප්‍රාදේශීය සභාවේ ගබඩා කාමරයේ විවිධ වර්ගයේ වත්කම් සහ තොග අයිතමයන් භාවිතයට සුදුසු සහ නුසුදුසු භාණ්ඩ වශයෙන් වූ විවිධ භාණ්ඩ පැවති අතර ඒවා හඳුනාගෙන අලුත්වැඩියා කිරීමට හෝ විනාශ කරදැමීමට කටයුතු කර නොතිබුණි. මෙවැනි අලුත්වැඩියා කර භාවිතා කළ හැකි භාණ්ඩ අසුරා ආරක්ෂිතව තැබීමට කටයුතු කර නොතිබුණි. | ක්‍රියාමාර්ග විධිමත් අයුරින් සිදුකළ යුතු වීම. | ප්‍රාදේශීය සභාව ගබඩා කාමරයේ පවතින විවිධ තොග අයිතමයන්ගෙන් භාවිතා කළ හැකි ඒවා හඳුනාගෙන අලුත්වැඩියා කිරීමටත්, අනෙකුත් ඒවා වෙන්දේසි කිරීම මඟින් විකිණීමට හෝ විනාශ කිරීමටත් ක්‍රියාමාර්ග ගෙන ඇත. |

### 3.5.3 වාර්ෂික භාණ්ඩ/ තොග සමීක්ෂණය

----------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ/ තොග සමීක්ෂණය, ප්‍රාදේශීය සභාව විසින් පත්කරනු ලැබූ තිදෙනෙකුගෙන් යුත් සමීක්ෂණ කමිටුව මඟින් 2019 ජනවාරි 30, 31 සහ පෙබරවාරි 01 දිනයන්හි පවත්වා තිබූ අතර මේ සඳහා ගෙවීම් වශයෙන් රු.6,000 ක් ගෙවා තිබුණි. මෙම සමීක්ෂණය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වාර්ෂික භාණ්ඩ/ තොග සමීක්ෂණය පැවැත්වීම සඳහා පත්කළ නිලධාරීන් භාණ්ඩවල සත්‍ය තත්ත්වය සනාථ කිරීම වශයෙන් තොග ලේඛනවල සැසඳීම් සිදුකර ගණනය කරනු ලැබූ බවට හෙළිදරව් කිරීම සඳහා තොග ලේඛනවල සලකුණු කර, සනාථ කර අත්සන් තබා නොතිබුණි. | ක්‍රියාවලින් අනුගමනය කළ යුතු වීම. | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ/ තොග සමීක්ෂණය සිදු කිරීමේදී ඔවුන්ට ඉදිරිපත් කළ භාණ්ඩාගාර සහ විගණන ............ අනුව තොගවල සත්‍යතාවයක් සසඳා පරීක්ෂා කිරීමෙන් අනතුරුව තොග ලේඛන සමඟ සැසඳීම් කර තිබුණි. එසේ වුවත්, තොග ලේඛනයේ වැරදීමකින් අත්සන් කර නොහැකි වී තිබුණි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා වූ වාර්ෂික භාණ්ඩ/ තොග සමීක්ෂණය 2018 දෙසැම්බර් 31 දින පදනම් කරගෙන සිදුකළ යුතුය. තවද, මෙම දිනට පසුව සිදු වූ ලැබීම් හා නිකුත් කිරීම් සම්බන්ධයෙන් ගැලපීම් සිදුකර අවසන් තොගය ගණනය කළ යුතු වුවත්, මෙම ක්‍රියාවන් | වාර්ෂික භාණ්ඩ/ තොග සමීක්ෂණය විධිමත්ව සිදුකළ යුතු වීම. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකිරීමේදී සමාලෝචිත වර්ෂයේ 2018.12.31 දිනට පැවති ශේෂය පදනම් කරගනිමින් සිදුකළ යුතුවේ. එසේ වුවත්, 2018.12.31 දිනට පසුව ලැබී තිබූ තොග සම්බන්ධයෙන් වූ තොරතුරු අවධානයට යොමු කිරීම එලදායී වේ. |

| | | | |
|---|---|---|---|
| | සම්බන්ධයෙන් ගණනය කිරීම් පිළිබඳ සැලකිලිමත් නොවී අවසන් තොග සමීක්ෂණය සිදුකර තිබුණි. | | |
| (ඇ) | වාර්ෂික භාණ්ඩ/ තොග සමීක්ෂණ කමිටුව විසින් සාක්ෂි සනාථ කිරීම් සිදුකළ පොදු 47 ආකෘතියේ “S” වශයෙන් සලකුණු යොදා හඳුන්වා දුන් භාණ්ඩ සම්බන්ධයෙන් විගණන දිනය වන 2019 අප්‍රේල් 30 දින, පරීක්ෂා කිරීමේදී මෙලෙස සලකුණු කර තැබූ භාණ්ඩ සංඛ්‍යාවෙහි වෙනස්කම් නිරීක්ෂණය විය. | වාර්ෂික භාණ්ඩ/ තොග සමීක්ෂණය විධිමත්ව සිදුකළ යුතු වීම. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් පොදු 47 ආකෘතියේ “බී” වශයෙන් දැක්වූ භාණ්ඩ සංඛ්‍යාව පිළිබඳව ගබඩා භාර නව නිලධාරියාට තහවුරු කළ නොහැකි විය. මක්නිසාද යත්, ඒවා අප සභාවට අයත් මහජන පුස්තකාලවල පැවති ඒවා වීමයි. |
| (ඈ) | වාර්ෂික භාණ්ඩ/ තොග සමීක්ෂණ මණ්ඩලය විසින් භාණ්ඩාගාරය සහ විගණන “66” යන ආකෘතියේ භාවිතා කරනු ලබන භාණ්ඩ හෙළිදරව් කළ යුතුය. එසේ වුවත්, මෙම භාණ්ඩ තොග සමීක්ෂණ මණ්ඩලය විසින් ඉහත ආකෘතියේ හෙළිදරව් කළ යුතු භාණ්ඩ සහ පොදු 47 ආකෘතියේ දැක්විය යුතු භාණ්ඩ වශයෙන් වෙන් වෙන්ව සමීක්ෂණය සිදුකර නොතිබුණි. උදා:ලෙස අලුත්වැඩියා කල නොහැකි තත්ත්වයේ දීර්ඝ කාලයක් පළුදු වී තිබූ ඩිජිටල් කැමරා 02 ක් භාවිතයේ පවතින උපකරණ ලෙස සලකා සමීක්ෂණයේ හෙළිදරව් කර තිබුණි. | වාර්ෂික භාණ්ඩ/ තොග සමීක්ෂණය විධිමත්ව සිදුකළ යුතු වීම. | තාක්ෂණික ස්වරූපයේ භාණ්ඩ අලුත්වැඩියා කළ නොහැකි තත්ත්වයෙන් පවතින විට එම භාණ්ඩ Gen-47 හි දැක්වීමට පෙර එය අලුත්වැඩියා කළ නොහැකි බවට තහවුරු කර තාක්ෂණික වාර්තා ලබාගැනීමට සිදු වී තිබුණි. එබැවින්, එය ලබා නොගැනීම හේතුවෙන් භාණ්ඩාගාර සහ විගණන 66 ආකෘතියේ දක්වා තිබුණි. |

**3.6 අරපිරිමැසුම් නොවූ ගනුදෙනු**

**වීථි ලාම්පු මිලදී ගැනීම සහ නිකුත් කිරීම**

ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂයේ රු.1,150,845 කට තම බල ප්‍රදේශයේ වීථි ලාම්පු සවිකිරීම සඳහා විදුලි භාණ්ඩ මිලදී ගෙන තිබුණි. මෙම ක්‍රියාවලිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මාර්ගවල වීථි ලාම්පු සවිකිරීමේ අවශ්‍යතාවය වෙනුවෙන් මහජන පැමිණිලි සහ ඉල්ලීම් අවම අයුරින් ලැබී තිබුණත්, සභාව විසින් වීථි පහන් 300 ක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලැබී තිබුණි. මහජන අවශ්‍යතාවයන්ට සුදුසු අයුරින් මෙම | මෙම ක්‍රියාවන් සම්බන්ධයෙන් විධිමත් සැලැස්මක් අනුව මහජන අවශ්‍යතා සපුරාලිය යුතු වේ. | ප්‍රාදේශීය සභාවේ පරිපාලනය මහජනතාව විසින් තෝරා පත් කළ මහජන නියෝජිතයන් විසින් පාලනය කරමින් පවතී. සභාපතිවරයා ඉටුකිරීමේ බලධාරියා වේ. එබැවින්, කොට්ඨාශ 11 කින් වූ ජනතාව තෝරා පත්කළ |

| | | | |
|---|---|---|---|
| | මිලදී ගැනීම් සිදුකළ යුතුවේ. | | නියෝජිතයන් මහජන අවශ්‍යතා ඉටුකිරීම සඳහා වගකිව යුතු අයව සිටිති. එමනිසා, ඔවුන් තම කොට්ඨාශවලට අවශ්‍ය වීථි පහන් අවශ්‍ය සංඛ්‍යාවට අනුකූලව පලමු අදියර වශයෙන් වීථි පහන් 300 ක් මිලදී ගැනීම සඳහා තීරණය කර තිබුණි. |
| (ආ) | මාර්ගවල සවිකරනු ලබන Wattage 65 විදුලි පහන් සෑම එකක්ම රු.1,450 කට මිලදී ගෙන තිබුණි. එසේ වුවත්, මඩකලපුව මහනගර සභාව සහ අනෙකුත් ප්‍රාදේශීය සභාවන් සමඟ සැසඳීමේදී මෙම ප්‍රාදේශීය සභාව විසින් මිලදී ගනු ලබන විදුලි පහන්වල සහ විදුලිබල ශක්තියේ මිලත් අධිකව පැවතුණි. | නිවැරදිව සැලසුම් කර කටයුතු සිදුකළ යුතු වීම. | මාර්ගවල සවිකරනු ලබන වීථි විදුලි පහන් බලශක්තිය 65 ට උපයෝගිත්වය පදනම්ව එළිය අධික බව දක්නට ලැබුණි. මක් නිසාද යත්, මෙය විදුලි කණු 04 කට එකක් බැගින් භාවිතා කළ හැකිව තිබුණි. මෙහි වටිනාකම අධික බව දක්නට ලැබුණත් එහි උපයෝගීතා කාලය ඉහළ බවක් දක්නට ලැබුණි. |
| (ඇ) | මාර්ග සඳහා විදුලි පහන් මිලදී ගැනීම සඳහා සභාව විසින් සෑම වර්ෂයකම අයවැය ඇස්තමේන්තුවෙන් වෙන්කරනු ලබන ප්‍රතිපාදනවලින් 95% ක ප්‍රතිපාදන උපයෝජනය කරනු ලබයි. එනමුත්. සමාලෝචිත වර්ෂයේ සභාවේ සභාපතිවරයා සහ සභිකයන්ගේ පෞද්ගලික කැමැත්ත පදනම්ව මේවා මිලදී ගෙන සවිකර තිබුණි. | නිවැරදිව සැලසුම් කර කටයුතු සිදුකළ යුතු වීම. | අප ජනතාවගේ පැමිණිලි සභිකයන් මාර්ගයෙන් දැනුම් දීමේ තත්ත්වයක් දක්නට ලැබුණි. මහජනතාව දැන් රාත්‍රී කාලයේ ගමන් කිරීමේදී පවතින අන්ධකාර තත්ත්වය, සොර සතුරු බිය සහ අනෙකුත් දුෂ්කරතාවයන් හේතුවෙන් බියට පත්ව ඇති බව දන්වා ඇත. තවද, මහජනතාවට අවශ්‍ය මාර්ග සම්බන්ධ ප්‍රශ්නවලය සම්බන්ධ අමාත්‍යවරුන් සමඟ සාකච්ඡා පවත්වා මූල්‍ය ප්‍රතිපාදන ලබාගනිමින් ප්‍රතිසංස්කරණ කටයුතු ද සිදුකරමින් පවතී. |
| (ඇ) | පසුගිය වර්ෂ 02 සමඟ සැසඳීමේදී 2016 සහ 2017 වර්ෂවලදී පිළිවෙලින් රු.658,000 ක් සහ රු.584,000 කටත් සහ සමාලෝචිත වර්ෂයේ රු.1,150,845 කටත් 2019 වර්ෂයේ අප්‍රේල් මාසය ඉකුත් වීමට පෙර රු.753,938 කටත් වීථි පහන් සඳහා අවශ්‍ය භාණ්ඩ මිලදී ගෙන තිබුණි. සභාව විසින් අධීක්ෂණය කළ යුතු සංවර්ධන මෙහෙයුම්වලින් එකක් වන වීථි ලාම්පු මිලදී ගැනීමේ ක්‍රියාවලිය කඩිනමින් අවසන් වීම නිරීක්ෂණය කළ හැකි විය. | නිවැරදිව සැලසුම් කර කටයුතු සිදුකළ යුතු වීම. | 2019 වර්ෂය ආරම්භයේදී වීථි විදුලි පහන් සවිකිරීම කටයුතු පමණක් නොව මාර්ග සංවර්ධනය පිළිබඳ වැඩසටහන් සම්බන්ධ අමාත්‍යවරුන් සමඟ සාකච්ඡා කොට මූල්‍ය ප්‍රතිපාදන සලසා ගනිමින් සංවර්ධන සැලසුම් ක්‍රියාවට නංවා ඇත. (C-K) කොට්ටෙයිකල්ආරු මාර්ගය සංවර්ධන කාර්යය 5M ලැබී තිබුණි. තවද, අනෙකුත් සැලසුම් සඳහා යෝජනාවන් සම්බන්ධිත පාර්ශවයන් වෙත යවා ඇත. |

**3.7 ප්‍රසම්පාදනය**

**3.7.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රාදේශීය සභාව විසින් සැපයුම් හා සේවා ක්‍රියාවලිය සඳහා සකස් කර තිබිය යුතුය. එසේ වුවත්, සභාව විසින් සැපයීම් සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. සේවාවන් සඳහා සභාව විසින් සකස් කළ ප්‍රසම්පාදන සැලැස්ම සැකසීම සඳහා පදනම් වූ මූලික ලියවිල්ල, යෝජනාවන් පළාත් පාලන ආයතනවල වර්ෂ 04 ක සංවර්ධන සැලසුම්වල අන්තර්ගත යෝජනාවල ඇති සේවාවන් ආදිය අනුගමනය නොකර සැලැස්ම සකස් කර තිබුණි. | චක්‍රලේඛවලට අනුව සැලැස්මක් වාර්ෂිකව ක්‍රියාත්මක කළ යුතු වීම. | සමාලෝචිත වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්ම භාණ්ඩ සඳහා පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි. එසේ වුවත් සේවාවන් සඳහා වූ ප්‍රසම්පාදන සකස් කර නොතිබුණි. එය පිළියෙල කිරීමේදී දැනට ජනතාව විසින් ඉදිරිපත් කළ පැමිණිලිවලට අනුකූලවත් මහජන නියෝජිතයන්ගේ උපදෙස්වලට අනුව සැලසුම්වලට ප්‍රමුඛත්වය ලබාදෙමින් සකස් කර ඇත. එබැවින්, ඉදිරියට එළැඹෙන වර්ෂවලදී මෙය මනාව සකස් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

**3.7.2 සැපයීම් හා සේවාවන්**

**(අ) කසළ එකතු කිරීමේ ප්ලාස්ටික් බඳුන් මිලදී ගැනීම**

සමාලෝචිත වර්ෂයේ සභාවේ අරමුදල් සහ දෙවන පෙළ සෞඛ්‍ය වැඩසටහන යටතේ, කසළ එකතු කිරීමේ ප්ලාස්ටික් බඳුන් 71 ක් රු.486,616 කට මිලදී ගෙන බෙදාහැර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | දෙවන පෙළ සෞඛ්‍ය වැඩසටහන යටතේ රු.150,000 කට කසළ එකතු කිරීමේ බඳුන් සහ නැවත භාවිතා කළ හැකි කසළ රැස්කිරීමේ මළු රාජ්‍ය ආයතන සහ මහජනතාවට බෙදාහැරීම සඳහා ප්‍රතිපාදන සලසා තිබුණි. නමුත්, සභාව විසින් රු.143,928 කට කසළ රැස්කිරීමේ ප්ලාස්ටික් බඳුන් 21 ක් පමණක් මිලදී ගෙන රාජ්‍ය ආයතනවලට පමණක් බෙදාහැර තිබුණි. | නිවැරදි ආකාරයෙන් සැලසුම් කර කටයුතු කළ යුතු වීම. | දෙවන පෙළ සෞඛ්‍ය වැඩසටහන යටතේ මිලදී ගනු ලැබූ කසළ රැස්කිරීමේ බඳුන් සහ නැවත භාවිතා කළ හැකි මළු මහජනතාවට ලබාදීමේදී දුෂ්කරතා මතු වී තිබුණි. මක්නිසාද යත්, අඩු ප්‍රමාණයක් වූ කසළ බඳුන් කිනම් ආකාරයක ජනතාවකට බෙදා දෙන්නේද යන්න තෝරාගැනීම අසීරු කටයුත්තක් ලෙස පෙනී ගිය බැවින් රාජ්‍ය ආයතනවලට පමණක් ලබාදී තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාවේ අරමුදල් මඟින් ජුනි මාසයේ ගනු ලැබූ තීරණයක් සඳහා කිසිඳු යෝජනාවකින් තොරව තවත් කසළ රැස්කිරීමේ ප්ලාස්ටික් බඳුන් 50 ක් මිලදී ගෙන රාජ්‍ය, මහජන ආයතන සහ ආගමික ස්ථාන සඳහා ලබා දී තිබුණි. | නිවැරදි අයුරින් සැලසුම් කර මහජනතාවට සේවාවන් සැපයීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතු වීම. | ඝන අපද්‍රව්‍ය වැඩි වශයෙන් ලැබෙන ස්ථාන හඳුනාගෙන ඒවා පහසුවෙන් එක්රැස් කිරීම සඳහා සභාව විසින් මිලදී ගත් ප්ලාස්ටික් බඳුන් 50 රාජ්‍ය, මහජන ආයතන සහ ආගමික ස්ථාන සඳහා ලබා දී ඇත. |
| (ඇ) | සභාව විසින් මිල කැඳවා තිබූ බඳුන්වල ප්‍රමාණය උදා: 1040mmXපළල 495mm ලෙස දක්වා තිබූ නමුත් මිලදී ගෙන තිබූ බඳුන්වල ප්‍රමාණය උදා: 980mm X පළල 480mm විය. | භාණ්ඩ හා සේවාවන් සම්බන්ධයෙන් මිලදී ගැනීම් සහ සේවාවන්වලින් පසුව පරීක්ෂා කළ යුතු වීම. | සභාව විසින් 110Lt, 150 Lt සහ 200 Lt බඳුන්වල උස 500 mm සහ පළල 950 mm බඳුන් මිල කැඳවා තිබුණි. එසේ වුවත්, අදාළ සැපයුම්කරු විසින් අපගේ ඉල්ලීමේ බඳුනේ (200 Lt) අමතර අයිතම ඒකක සඳහන් වීමක් නිසා එය ගුණත්වයෙන් ඉහළ බවත් මිල අඩු බවත් නිසා එය මිලදී ගැනීමට තීරණය කෙරුණි. ඒ අනුව, සැපයුම්කරු විසින් සැපයූ බඳුන්වල ප්‍රමාණය 200 Lt ප්‍රමාණයේ ඒවා විය. එසේ වුවත්, මිම්මෙහි සැලැස්මේ සුළු වෙනස්කම් පැවතුණි. |
| (ඇ) | ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ තේට්ට්‍රාතිවූ කොට්ඨාශයේ පානීය ජලනල එළීම සඳහා මඩකලපුව ප්‍රාදේශීය ජල සම්පාදන හා මලාපවාහන මණ්ඩලය විසින් සභාවට රු. 1,494,167ක් 2018 ඔක්තෝබර් මාසයේදි ගෙවා තිබුණි. නමුත්, විගණන දිනය වන 2019 අප්‍රේල් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි. එමනිසා එම ප්‍රදේශයේ ජීවත්වන ජනතාවට පානීය ජලය නොමැතිකමෙන් මහත් දුෂ්කරතාවන් මුහුණ පෑමට සිදු වී තිබුණි. | නියමිත කාලවකවානුව තුළ මහජනතාවට සේවාවන් සැපයීමට අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු වීම. | “SDG” සැලැස්ම යටතේ 2018 වර්ෂයේ තේට්ට්‍රාතිවූ පවුල් පදිංචි කළ ගම්මානයේ පානීය ජලය බෙදාහැරීමේ වැඩසටහන අවසන් වී නොතිබුණි. මේ සඳහා වැට හරහා පමණක් ගම්මානයට ජල නළ එළීම සිදුකළ යුතු වීමයි. එසේ වුවත්, ජල මට්ටම ඉහළ ගොස් තිබීම නිසා ජල නළ එළීම සිදුකළ නොහැක. දැන් නියං සමය නිසා ජල මට්ටම පහත බසිමින් පවතින බැවින් කාර්යයන් ආරම්භ කිරීමට නියමිත බව දන්වා සිටිමි. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උප වගන්තිය අනුව වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උප වගන්තිය අනුව ක්‍රියාකළ යුතුය. | වාර්ෂික කාර්යසාධන වාර්තාව, මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු බවට සඳහන් කරුණ සම්බන්ධයෙන් දැනුවත් භාවයක් නොතිබීම නිසා එලෙස ඉදිරිපත් කර නොතිබුණි. එම |

| | | |
|---|---|---|
| | | නිසා, ඉදිරියට එළැඹෙන කාලවලදී පිළියෙල කර ඉදිරිපත් කිරීම සඳහා කටයුතු කර ඇත. |

**4.2 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සභාවේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු වී නොතිබුණි. | විධිමත් ආකාරයෙන් සැලසුම් කර විගණන කාර්යයන් සිදුකළ යුතු වීම. | වර්තමානයේ අභ්‍යන්තර විගණනය භාරව ප්‍රධාන කළමනාකාර නිලධාරිවරයා පත්කර අභ්‍යන්තර විගණන වාර්තාව ඉදිරිපත් කර ඇත. |

**4.3 විගණන හා කළමනාකරණ කමිටු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සභාව විසින් විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | විධිමත් ආකාරයෙන් සැලසුම් කර විගණන කාර්යයන් සිදුකළ යුතු වීම. | සභාව මඟින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සඳහා සැලසුම් කර ඇත. |

**5. පද්ධති හා පාලන**

පහත සඳහන් ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පාලන ක්ෂේත්‍රය | විශේෂ අවධානය යොමු කළ යුතු විෂයයන් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) ආදායම් කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම. | චක්‍රලේඛ හා පනතේ විධිවිධානවලට අනුව ක්‍රියාකළ යුතුවීම. | ඔබ විසින් සඳහන් කළ ආදායම් කළමනාකරණය, අයවැය පාලනය සහ ස්ථාවර වත්කම් පාලනය ආදිය පිළිබඳ මුළු අවධානය යොමු කර ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (ආ) අයවැය පාලනය | අයවැය පිළියෙල කිරීමේදී පසුගිය වර්ෂවල තථ්‍ය වියදම් කෙරෙහි අවධානය යොමු කළ යුතුය. | අයවැය පිළියෙල කිරීමේදී පසුගිය කාලයේ තථ්‍ය වියදම් සැලකිල්ලට ගත යුතු වේ. | |
| (ඇ) ස්ථාවර වත්කම් පාලනය | (i) ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගැනීම.<br>(ii) සභාවේ භාවිතා නොකර නිෂ්කාර්යව පවතින ස්ථාවර වත්කම් භාවිතා කිරීමටපියවර ගැනීම. | | |